


පතින් පත පෙරලා
පොතින් පොත අර ගන්න
පොතක් අල්ලන්නටම
මැවුනා වැනි
අතකි

පැහැපත
සිහිනි
දිග
ඇඟිලිය

පිලිඹිබු විය හැකිද
රසික මත
සුමුදු අතැඟිලි
තුඩු මත
මල් පෙතිවලින් මුද්‍රිත පොතද
නොරිදා පෙරලිය හැකි

අපේ අත් පොත් මත
එක ලග නතර වූයෙය
අහා මේ මනරම්
හිම්දිරි උදය සුවඳකි
මතු වන්නට හැකිය කවියක රස
රසිකාවියක සුවඳ ලෙස?

අපේ අත් නැවතින
අපේ ඇස් එක් විය
පොතපතට කල ඇල්මෙන
පින් කල බව දැනින

මේ නම් රසික දෑසකි
හොඳම කවි කියවා ඇති
සිංදු පද උඩ පාවෙන
නංගියෙකුට වැඩිය

මට පෙන්නුවා ඈ
උකුල උනුහුම රැඳි
ඇගේ කැමතිම පොත්
ඈට පෙන්නුවා මම
තාම හද ගැස්ම රැන්දුන
මගේ කැමතිම පොත්

අපේ අත් නැවතින
සිව් ඇස මුන ගැසින
හද කවි නටන්නට විය
අප දෙදෙනාගේ හදගත්
පොත් දෙක දෙක බැගිනි
මනාවට ගැලපෙන
ගත් මෙනිය අතිනත්
අපේ හිත්ගත් පොත්

එක සාහිත්‍ය මාසෙක
මනහර සැඳෑවකි
පොත්සල රසික යායකි
එකම ඉරනම් කවි පොතක් මත
අපේ අත් මුන ගැසින
අපේ ඇස් එක් විය

මා එදින කිව්වේ
කලක් මා සිත ගෙතූ කියුමකිද

"අකමැතිද අපි දෙන්නම
පොතකින් එකක් විතරක්
ගන්න?,"

ඇගේ මුව ගොලූ විය
ඇස් බිමට යොමු විය
මා හද මතක කවි
හුදු වාර්තා බවර පෙරලින
එහෙත් ඒ අත එසවින
වලලූ වීනා ගෑවෙය
දෙදෙනාම අත තැබූ
පොත මවෙත දිගු වින

"එහෙනං
ඔයා කියවලා මටත් දෙන්න,"

ඒ මිහිරි ලජ්ජා මදහස
මහරුම හයිකු කවියකි
සාමකාමී උදයක
විහගෙකු ගැයූ ගීයකි

සුලඟක අහම්බෙන් ආ
සමන් මල් සුවඳකි
තිබෙයි අපෙ ගෙදර දැන්
පොත් වලට වෙන් වූ කුටියක්
දල්වන ඈ සැඳෑ කල
බුදු සාදුටද පහනක්
තිබෙයි අප හද මැදුරුවල
ඒ පොත් මුන ගැසුන දවසක්
වෙනමම රාක්කෙක
තිබෙයි පොත් වගයක්
එකින් දෙක දෙක පිටපත්

ගෙදර කරදර ඇති
හිතේ පීඩා ඇති
සමහර දවස්වල
ඒ රාක්කේ පොත්
වෙන වෙනම ගෙන කියවමු
තනි තනිවම නිහරැව
අපට වෙන් වූ තැන්වල

ඇගේ පොත්වල
සහ මගේ පොත්වල
අපේ පොත්වල නැති මිහිරකි
සුලඟක අහම්බෙන් ආ
සමන් මල් සුවඳකි
සිනාවක් වැනි උදයක
විහගෙකු ගැයූ ගීයකි

මා සොඳුරට හොරෙන්
ඒ පිටු සිඹින කල
විඳින්නේ කවි උපන් දවසකි
එහෙත් එක් දවසක
ඒ පොත් රාක්කය අස
පොතක් දෝතින් ගෙන
ඈ සිඹින බව දැක
මා හද කපා ගිය හීයකි

එහෙත් සුහදිනි එය
කවියක් කරන රිදුමකි
අරුතක් සහිත විඳුමකි

**ලියනගේ අමරකීර්ති**
**(එකමත් එක පිටරටක)**

## කවි තේරවිල්ල

නූල් නූල් නූල් නූල්
අඟර දඟර අඟර දඟර
මුලකුත් නෑ අගකුත් නෑ
හරි හැඩයක් ඇත්තේ නෑ

වේවැල් ඇඳ මත නැගලා
එක උඩ එක ගොඩ ගැහිලා
බිම බැලුවම නටන වතුර
ඇඟ පිචවෙන දුම් වළල්ල

පිළිතුර
ඉඳිආප්ප -

## යොවුන් හද

ගැටයා සන්දියේ
පෝය දා රෑට ගමේ පන්සලේ
පායන තරම් අපූරුවට
මෙහි පායන්නේ
නැත්තෙ ඇයි ද
සඳ?

නිහාල් රූපසිංහ




මගෙ හදවත තුළ ඔබ හැංගී ගෙන පැය විසි හතරෙම වද දෙනවා
මගෙ හිත මැද්දේ ඔබ ගුලි ගැහි ගැහි හැම මොහොතෙම මා අඬවනවා

ඔබ එළවන්නට හිතට දුකයි මගෙ ඒකයි මෙපමණ කල් සිටියේ
තව දුරටත් බෑ ඔබට නවාතැන් සලසන්නට හදවත් කුටියේ

අළුත් නිවහනක් සොයා නොගත්තොත් වැඩ දුර දිග යාවි
මහ මග තනියම හිඟමන් යැද යැද ඉන්නට සිදු වේවි

විකසිත මල් ගොමු බැබළෙන තරු පොදි බල බල හිනැහෙන්නට ආසයි
හැම තත්පරයම ඔබ ළඟ හින්දා හදවත ඒ කිසිවක් නාසයි

ඔබ හිනැහෙන්නේ කවදා කෙලෙසද දැඩි වෙහෙසක් විඳ ගෙන හෙව්වා
මගේ දෙනෙත් තුළ කඳුළු නැගෙන විට ඒ මත ඔබ හසරැළි මැව්වා

මා හිනැහෙන විට ඔබ ඔරවනවා හිත තුළ නැග එන සතුට මරා
මා වැළපෙන විට ඔබ හිනැහෙනවා උපහාසය දෙනුවනෙහි දරා

හිනැහෙන දෙනෙතක කඳුළැලි නංවා පීවත් වීමෙන් කිම ද පලේ
රතු වුණු දෙනෙතක හසරැළි නංවා  පෙන්වනු මැන මට ඔබගෙ බලේ

පැළපදියම් වී මගෙ හදවත මැද බලහත්කාරයකින් වාගේ
මා අඬවන්නට, හිත රිදවන්නට හේතුව කිමදැයි මට නෑගේ

ඔබ හා එක් වී කඳුළැලි පෙරුමට මුළු තුන්සිය හැටපස් දවසේ
මගේ කැමැත්තක් නෑ ඔබ පිටවෙනු මට ඉන්නට ඉඩ දී සුවසේ

තව ටික දිනකින් අලුත් අමුත්තෙක් මගෙ හදවත තුළ රජ වෙනවා
ඉන් පෙර නොගොසින් ඔහු හා සටනට පැමිණියහොත් ඔබ පැරදෙනවා

**මාලා කරුණාතිලක** කුරුණෑගල

## අත්තම්මා

*(අත්තම්ම ඉස්සරහ ඉටිපන්දමක් පත්තුකරගන්න බැරිවෙච්ච පළමුවැනි අවුරුද්ද මේක)*



ඉල්මහේ සීතලේ      අවදිව
කල්පනා කරමි රෑ මැදියම
කල්පයක් තරම් දිගු මතකය
නිල් අහස පළලටම නිසල ය

මළවුන්ගෙ මාසයේ රුධිරය
කළපුවක මෙනි හරිම සසල ය
මළගෙයක හැඬුම්බර කටහඬ
නළ මුදුව ගලා ඒ කුටියට

ගල්කිස්ස සුසානේ සැතපෙන
අත්තම්ම නෙතේ වූ කඳුළක
සද්දන්ත සෙනේහේ සිසිලත
නිස්සද්ද මගේ ළය කළඹන

විඩාබර කතෝලික කුරුසිය
සදාදර ඇගේ හිස අබියස
කතා කර පුතේ යැයි අමතන
ඇගේ නෙත මගේ නෙත සනහන

අන්තෝනි පල්ලියේ සියොළඟ
වීන්තාරු කළ නොහෙන සුරුවම
කන්තාරු ගීතිකා තටු ගෙන
නින්නාද නඟාගෙන පියඹන

කැරලි කෙහෙරැලි නැගුණු මගෙ හිස
ඇඟිලි තුඩු හොවා තඩි විමසන
සරැලි නග නගා කවි කිය කිය
කෙවිලියක විලාසෙන් හිනැහුණ

පැල්පත් ම කිව නො හෙන නිවසේ
පොල් පත් ය සෙවෙනි කර තිබුණේ
ඉල් මහේ වස්සාන වතුරේ
හිල් තුළිනි ඈ නින්ද පෙඟුණේ

ගොප් කොළින් සැරසුණා මඟ දිග
ලොප් වුණා මගේ කල දවස ම
දුක්වෙලා පළක් නැති අඳුරට
රොක් වුණා මගේ කවි සපුව ම

රොටියක් ඔබේ අතින් වළඳන්න
ගුටියක් කකා හිත ම සනසන්න
ඉටිපන්දමක් රැගෙන පැමිණෙන්න
කෙටි මඟක් තිබේදැයි කියපන්න

**මංජුල වෙඩිවර්ධන**

අන්තර්ජාලයේ සාහිත්‍ය කවුළුව
www.ketapathpawra.com

# එන්නෙමි ඔබ බලන්නට

ඉන්නෙමි නොඉවසිල්ලෙන් බලා
ගුවන් යානය එනතුරා මම
ඉවසා සිටියත් මෙතෙක් කල් මා
කිමද අද මේ නොඉවසිල්ලක්..

දැනගත් දා සිට ඔබ
ඔත්පල වී ඇති බව තාත්තේ
යයි මුළු ගත ම මගේ
සීතල වී වරින් වර
එන්නට හනික අත-මිට
සරු නැතත් මට
හැකි ඉක්මණින් එන්නෙමි තාත්තේ
බලන්නට ඔබ අපේ ගෙදරට

යහනට යන හැම රැයකම
දෙනෙත් බොඳ වෙයි මතක් වී ඔබ
නින්ද අසළක නැති
එවන් මොදහාතක
හැඬුවෙමි මම තාත්තේ
මුහුණ වසා ගෙන
මගේ දූ පුතු
බිරිඳට ද හොරෙන්

කිසිදු අඩුවක් නොදී
මා උස් මහත් කළ බව
නැත ගසා නිය පිටින් පාරක්
මේ වන තුරා මට..
දකිනා තුරු ඔය  මුහුණ යළිත් මට
ජීවත් විය යුතුයි තාත්තේ ඔබ
අරගෙන මගේ ආයුෂත්.

-සංජීක සමරනායක -

# පහන් වැට

සංස්කරණය  තුෂාරී ප්‍රියංගිකා

## නොයෙන ගමන් ගිය ආදර පුතුනේ

අඳුරු වළා ගැබ කඳුළු සළන්නට
නිල් ගුවන වසා සිටියා
සඳට කියන්නට එළිය නොවන්නට
හිරු මුහුණ වසා සිටියා
හිතේ තියෙන දුක කියා ගෙවෙන්නට
සුසුම් පොදක් හෙළුවා
කොහොම දරන්නද ඔබගෙන් වෙන් වී
පුතුනි ඔබේ අම්මා...

දෝතට ගෙන දුන් මැණිකක් වාගේ
ඔබව තුරුල් කරලා
හදේ තෙමා ගිය ආදර කිරි දිය
ඔබේ මුවේ තියලා
පිනි පොකුරු වගේ පොඩි සිනහව ඔබගේ
මවගේ මුහුණ මත වැටිලා
ලොවේ වෙනත් නැත ඔබ තරමට වැඩි
වටින දෙයක් නිම්මා...

පුතුනි ඔබේ ඇති රන්දිය දිලිසුම
මුළු ලොවම එළිය කරලා
තරඟ නගා ගංගාවක් මෙන් ඔබ
මහා සයුර බලා ගැලුවා
ලා දළු මැළ වී ගිනිගත් සුළඟින්
ඔබ අප හැර ගිය දා
පූදින තල මල සේ අනියත බව
මතකය අවදි කළා..

-පුෂ්පිකා ගමගේ